





තොරතුරු :

ටී. පී. ජී අරුණ යසපාලිත,
කෘෂිකර්ම උපදේශක,
සේවාගම, පොළොන්නරුව.

## වන පළතුරු අතරට. . .

# බොරදමන



බොරදමන හෙවත් බොරදමනිය *Grewia polygama* යන විද්‍යාත්මක නාමයෙන් හැඳින්වෙන අතර Tiliaceae කුලයට අයත් ලංකාවේ වියළි කලාපයේ දැකිය හැකි ශාකයකි. බොරදමන වලට අමතරව මෙම කුලයට අයත් වන පලතුරු ලෙස දමින්න, ජැම්, ගස්කැලිය, වැල්කැලිය හා කොහොකිරිල්ල ආදිය දැක්විය හැකිය.

ගසක් මීටර් 6 - 12 විතර උසකට වැඩේ. කඳ අළු/ දුඹුරු පැහැයට හුරුය. පත්‍ර තරමක් ජැම් පත්‍ර වලට සමානය. පත්‍රය මධ්‍ය නාරටිය හරහා අසමමිතිකය. පත්‍රයේ අග කෙලවර උල්වී ඇත. එය දිගින් සෙන්ටිමීටර් 5 - 8 ක් වන අතර පළලින් සෙන්ටිමීටර් 3 - 4 ක් පමණ වේ. අතු වල පත්‍ර මාරුවෙන් මාරුවට පිහිටන පරිදි සකස් වේ. මෙම පත්‍ර සියුම් රෝම වලින් වැසී පවතින අතර දළු පත්‍ර මදක් රත් පැහැතිය.

අතුවල, පත්‍ර කක්ෂවලින් මල් හට ගන්නා අතර ඒවා කහ පැහැතිය. මල් තනිව හෝ 2 - 6 ක් අඩංගු කුඩා පොකුරක් ලෙස සකස් වේ. මෙම ගස්වල ඵල බොහොමයක් හට ගන්නා අතර ඒවා වටකුරුය ගසේ සමහරවිට දෙබිඩි ගෙඩිද දැකිය හැකිය. සෙන්ටිමීටර් 0.3 - 0.8 විතර විෂ්කම්භයෙන් යුක්ත විය හැකි අතර මෙම ඵලද සියුම් රෝම වැනි ව්‍යුහයන්ගෙන් ආවරණය වී පවතී. ගෙඩි අමු කාලයේදී අළු කොල පැහැයක් ගන්නා අතර ඉදුණු පසු දම් කළු පැහැයක් ගනී. ඵලය ඇතුළත පටක දම්/ රතු පැහැතිය. ඵලයක් තුල බීජ දෙකක් හෝ එකක් පවතී. ව්‍යාප්තිය සිදුවන්නේ මෙම බීජ මඟිනි.

මෙම ඵල වනගත පලතුරක් ලෙස භාවිතා කරන අතර අමු කාලයේදී සෙවල ගතියකින් යුක්තය. ඉදුණු පසු ඇඹුල් රසකින් හා ආවේණික මිහිරි රසයකින් යුක්තය. ගෙඩි ඉදෙන විට ගස් කුරුල්ලන්ගෙන් පිරී පවතී. පලතුරට අමතරව බොරදමන ගසෙහි පොතු හා කොළ ආයුර්වේද හා දේශීය වෛද්‍ය විද්‍යාවේදී තුවාල සඳහා ආලේපනයක් ලෙස යොදා ගනී.